ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය නැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

'අ' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර යුගයේ ඇරඹි නව වාස්තු විද්‍යා ප්‍රබෝධය බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ රැසක් බිහිවීමට හේතු විය.

(i) භික්ෂූන් වහන්සේලා සඳහා නිර්මාණය කරන ලද ගර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිල්ලක්ගම බෝධිඝරය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05 යි)

(iii) අනුරාධපුර ඉදිවූ කුට්ටම් පොකුණ සහ පොළොන්නරුවේ ඉදිවූ නෙළුම් පොකුණ අගනා ශෛලමය නිර්මාණයන් ය. ආකෘතිය හා ශිල්පීය කුසලතාව පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

2. ශ්‍රී ලංකාවේ ආගමික සිතුවම් නිර්මාණකරණයේ නියැලුණු චිත්‍ර ශිල්පීහු විවිධ තේමා යටතේ විශිෂ්ට නිර්මාණ බිහි කළෝ ය.

(i) නාරායන ස්වාමි ශිල්පියා විසින් වැල්වැටිතුරෙයි මුත්තු අම්මාන් කෝවිලෙහි ඇඳ ඇති සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඩෙවිඩ් පේන්ටර් ශිල්පියා විසින් සිතුවම් කරන ලද මහනුවර ත්‍රිත්ව දෙවි මැදුරේ දක්නට ලැබෙන 'යහපත් සමරිතානුවා' සිතුවම පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) 'මාර පරාජය' බෞද්ධාගමික චිත්‍ර ශිල්පීන් විසින් විවිධාකාරයෙන් සිතුවමට නගා ඇත. බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් ඇඳි ජෝර්ජ් කීට් ශිල්පියා හා බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් ඇඳි සෝමබන්දු විද්‍යාපති ශිල්පියා 'මාර පරාජය' සිතුවම් කළ ආකාරය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

3. පොළොන්නරු යුගයේ දී හින්දු ආගමික සංකල්ප මත පදනම්ව ආගමික මූර්ති ගණනාවක් දේවාල ආශ්‍රිතව නිර්මාණය කර ඇත.

(i) හින්දු ආගමික මූර්ති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශිව සෝමස්කන්ධ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) හින්දු ආගමික මූර්ති අතර නටරාජා මූර්තිය සුවිශේෂී වේ. එහි සංකේත භාවිතය හා කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

[දහවනි පිටුව බලන්න.

'ආ' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. ගන්ධාර හා මථුරා ගුරුකුල බෞද්ධාගමික මූර්ති රැසක් ලොවට බිහි කළ කලා මධ්‍යස්ථානයන් ය.
X

(i) ගන්ධාර කලා සම්ප්‍රදායේ නිර්මාණය වූ ප්‍රතිමා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සඳහා ගන්ධාර කලා සම්ප්‍රදාය ඉවහල් වී ඇති ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 05 යි)

(iii) මථුරා හා සාරානාත් ගුරුකුලයන්හි නිර්මාණ ගුප්ත යුගයේ දී ඉතා උසස් තත්ත්වයට පත් විය. ඉහත කියමන සනාථ කිරීම සඳහා මථුරා හා සාරානාත් බුදු පිළිමවල ප්‍රගස්ත මූර්තිමය ලක්ෂණ හා භාව ප්‍රකාශන ඇසුරෙන් පහදන්න. (ලකුණු 08 යි)

5. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු ජන කොට්ඨාසයක් විසූ පෞරාණික ජනාවාසයකි.

(i) ඉන්දු නිම්න වැසියෝ කලා කෘති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉන්දු නිම්න වැසියෝ මානව රූප සියුම්ව අධ්‍යයනය කොට නිර්මාණය කිරීමට දක්ෂතා ඇත්තෝ වූහ. **එක්** උදාහරණයක් ගෙන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ඉතා දියුණු ගෘහ නිර්මාණ තාක්ෂණයක් පැවති බවට සාක්ෂි හමුවී ඇත. ඉහත කියමන ඔවුන්ගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන්, උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08 යි)

'ඉ' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. යුරෝපයේ තදාසන්න රාජ්‍යයන් දෙකක් වන ග්‍රීසිය හා රෝමය කලා නිර්මාණ රැසක් ලොවට දායාද කළ දේශයන් විය.
X

(i) ග්‍රීක සම්භාව්‍ය යුගයේ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) රෝම වාස්තු විද්‍යාවේ සුවිශේෂී නිර්මාණයක් වූ ට්‍රාජන් කුලුණ (The Trajan Column) ගැන කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ග්‍රීක හා රෝම ශිල්පීන් මානව රූපය, සිතුවම් සඳහා යොදා ගත් ආකාරය හා අවස්ථාවන් ඇසුරෙන් සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

7. ඉතාලියේ බිහි වූ පුනරුද සමය, අග්‍රගණ්‍ය කලා කෘති රැසක් ලොවට බිහිකළ අවධියකි.

(i) මයිකල් ඇන්ජලෝ විසින් නිර්මාණය කරන ලද සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පුනරුද කලාවේ පොදු ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)

(iii) ලියනාඩෝ ඩාවින්චිගේ 'පර්වත මස්තකයේ දේවමෑණියෝ' සහ රෆායෙල් සන්සියෝගේ 'ඇල්බා මැඩෝනා' යන සිතුවම් පිළිබඳ ආකෘතිය හා කලා ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

* * *